# 1.18 ශ්‍රී ලාංකේය ථෙරවාද බෞද්ධ සංස්කෘතියෙහි තාන්ත්‍රික ආභාසය

පූජ්‍ය වැලිමඩගම කුසලධම්ම හිමි
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

බුද්ධ පරිනිර්වාණයෙන් සියවස් තුනකට පසු මිහිඳුමාහිමියන් ඇතුළු ධර්මදූත පිරිස ලක්දිවට රැගෙන එන ලද්දේ තෙවැනි සංගීතියෙන් අනුමත කරන ලද ථෙරවාද බුදුදහමයි. එම දහම පදනම් කොට ගොඩනැගුණු සංස්කෘතිය ථෙරවාදී බෞද්ධ සංස්කෘතියයි. බුද්ධ පරිනිර්වාණයෙන් වසර දහසකට පසු භාරතීය චින්තනයේ සිදු වූ නව ප්‍රවණතාවක් හෝ වර්ධනයක් "බෞද්ධ තන්ත්‍රවාදය" නැතහොත් තාන්ත්‍රික බුදුසමය නමින් හඳුන්වනු ලැබේ. තන්ත්‍රවාදය කුමක්දැයි සැකෙවින් හඳුන්වා ඇත්තේ "අනල්ප වූ අර්ථ සමුදායක් ප්‍රචාරය කරනු ලබන හෙයින් ද දර්ශනය හා චරණය යයි අංශ දෙකකින් සමන්විත, අර්ථ පතුරුවන බැවින් ද පරිත්‍රාණය සලසා දෙනු ලබන බැවින් ද ඊට තන්ත්‍ර යයි කියනු ලැබේ." යනුවෙනි.

ක්‍රි.පූ. පළමු සියවසෙන් පසු භාරතීය බෞද්ධ චින්තනයේ ඇති වූ නව ප්‍රවණතාවන් බොහෝමයක් ශ්‍රී ලංකාවට ද සංක්‍රමණය වී ඇති බව ඓතිහාසික මූලාශ්‍රයන්ගෙන් පෙනේ. ඒවා අතර තාන්ත්‍රික බුදුසමය ද වේ. එසේ පැමිණි අවස්ථාවන් ලෙස 1 වැනි සේන (ක්‍රි.ව. 833 - 853) සමයේ වාජිරියවාදය ලෙස ද, II සේන හෙවත් මුගයින්සෙන් (ක්‍රි.ව. 853 - 887) දවස නීලපටදර්ශනවාදය ලෙස ද, 8 වන ශතවර්ෂයේ දී පල්ලව රාජ්‍යයේ නරසිංහ වර්මන් රජුගේ කාලයේ වජ්‍රබොධි නම් තාන්ත්‍රිත භික්ෂුවගේ පැමිණීමෙන් ද, අභයගිරියේ සිට වජ්‍රබෝධි හිමියන් සමඟ උන්වහන්සේගේ ශිෂ්‍යයෙකු වූ අමොඝවජ්‍ර චීනයට වජ්‍රයානය ප්‍රචාරය කළ බව සඳහන් වීමෙන් ද, සර් ජෝන් වුඩ්රෝෆ් කියන ආකාරයට ටිබෙට් ඉතිහාස කතාවට අනුව තන්ත්‍රයානය ව්‍යාප්ත රටවල් 56 න් ශ්‍රී ලංකාව එකක් වීම ද, ආදී කරුණු ශ්‍රී ලංකාව ට තාන්ත්‍රික බුදුසමය පැමිණි බවට සාධකයෝය. මෙසේ පැමිණි තාන්ත්‍රික බුදුසමය මෙරට ථෙරීය බෞද්ධ සංස්කෘතිකාංග හා බද්ධ වී ඇති බව පෙනේ.

ථෙරවාද බෞද්ධ සංස්කෘතිකාංගයක් වූ බෞද්ධ කලා ශිල්පයන් ඒ අතර වැදගත් තැනක් හිමිකර ගනී. මෙයට උදාහරණ ලෙස තිසාවැව අසල යන්ත්‍රගල, නාලන්දා ගෙඩිගෙය, බුදුරුවගල, අනුරාධපුර විජයාරාම ස්තූපයෙන් සොයාගත් තඹතහඩු, ලක්දිව විවිධ පළාත්වලින් සොයාගත් "හාපය පාර පාර ස්වාහා" යන මන්ත්‍ර සහිත මැටිඵලක, පොළොනනරුවේ පබළු වෙහෙරින් සොයාගත් "ඕං මණි පද්මේ ස්වොස්ති" ආදී මන්ත්‍ර සහිත තහඩු, තාරාදේව ප්‍රතිමා මණ්ඩලයක ආකෘතිය ගත් මැදිරිගිරිය, පොළොන්නරුව වටදාගෙවල්, විශ්වවජ්‍ර, පද්ම සංකේත හා පඤ්චධ්‍යානි බුද්ධ සංකල්පය ආදීය නිරූපිත පොළොන්නරුවේ ගල්විහාර කලාව ආදිය දැක්විය හැකිය.

මෙයට අමතරව සාහිත්‍යාගත තාන්ත්‍රික අභාසය අතර 1 වැනි සේන රජු විසින් රචිත ධම්පියා අටුවා ගැටපදය, තිසර සංදේශය, අභයගිරි සම්ප්‍රදායට අයත් තාන්ත්‍රික කෘති ලෙස නිකායසංග්‍රහ කතුවරයා දක්වන මයාජාලතන්ත්‍රල සමාජතන්ත්‍ර, භූතඩාමරතන්ත්‍ර ආදී ග්‍රන්ථයන් ද, ආගමික වශයෙන් ජිනපඤ්ජරය, ගිනිපිරිත. ජයපිරිත, ආදී පිරිත් සූත්‍රයන් ද සීවලී යන්ත්‍ර, රත්නයන්ත්‍ර ආදී දැද උපයෝගී කොට ගනිමින් ශ්‍රී ලාංකේය ථෙරවාද බෞද්ධ සංස්කෘතියේ තාන්ත්‍රික අභාසය පිළිබඳ පර්යේෂණායක යෙදීමට අපේක්ෂා කෙරේ.